**විධිවිධාන අංකː 01/2018** 2018 ජනවාරි 18

**සියලුම බලපත්‍රලාභී ගෙවීම් කාඩ්පත් පිළිබඳ මූල්‍ය අත්පත්කරුවන් වෙත,**

## ගෙවීම් කාඩ්පත් මඟින් සිදු කරන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත් කර ගැනීම සඳහා වූ විධිවිධානය

මෙම විධිවිධානය, 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝගයන් හි 18 වන නියෝගය යටතේ නිකුත් කරන ලද අතර එම නියෝග යටතේ බලපත්‍රලාභී ගෙවීම් කාඩ්පත් පිළිබඳ මූල්‍ය අත්පත්කරුවන්ට අදාළ වේ.

ගෙවීම් මාධ්‍යයක් ලෙස ගෙවීම් කාඩ්පත් පිළිගැනීමට සහ තෙවැනි පාර්ශ්වයන් විසින් මිලට ගත් භාණ්ඩ සහ සේවාවන්හි වටිනාකම උපාදානය කිරීමට, තෙවැනි පාර්ශ්ව සමඟ විධිවිධාන සකස් කරන බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන්හට, මංගත කාඩ්පත් ගෙවීම් ක්‍රමවේදය ආරම්භය සඳහා පහසුකම් සලසන ආයතන (මෙහි මින්මතු මෙම ආයතන "සේවා සැපයුම්කරුවන්" ලෙස හැඳින්වේ) හරහා ගෙවීම් කාඩ්පත් මඟින් සිදු කරන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත් කරගත හැකිය. ස්වකීය අන්තර් ජාල ගෙවීම් වේදිකාව/ද්වාරය හරහා සිදු කෙරෙන විද්‍යුත් වාණිජ ගනුදෙනු වල වෙළෙඳුන් සඳහා වන ගෙවීම් බේරුම් කිරීමට බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් හට සේවා සැපයුම්කරුවන්ගේ සහාය ලබාගත හැක.

මෙම විධිවිධානය නිකුත් කිරීමේ අරමුණ වෙළෙඳුන්ට කාලීන ගෙවීම් සිදු කිරීම සුරක්ෂිත කිරීම සහ කාඩ්පත් හිමියන්ගේ අභිරුචිය ආරක්ෂා කර ගැනීම සඳහා ගෙවීම් කාඩ්පත් මඟින් සිදු කරන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත් කරගැනීමේ කොන්දේසි නියම කිරීම වේ. මෙම විධිවිධානය 2018 ජනවාරි මස 18 වැනි දින සිට බලාත්මක වේ.

සේවා සැපයුම්කරුවන් හරහා ගෙවීම් කාඩ්පත් මඟින් සිදු කරන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත්කර ගැනීමට අදහස් කරන බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් පහත සඳහන් කොන්දේසි අනුගමනය කළයුතුය.

2.1 බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන්, අපේක්ෂිත සේවා සැපයුම්කරුවන්ගේ හැකියාවන් තක්සේරු කිරීමේදී උපරිම ආරක්ෂාව සලසා ගත යුතුය.

2.2 භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ගෙවීම් මාධ්‍යයක් ලෙස ගෙවීම් කාඩ්පත් පිළිගැනීමට පහසුකම් සැපයීම සඳහා බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන්, සේවා සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් වලට එළඹිය යුතුය. එක් එක් පාර්ශ්වයේ කාර්යභාරයන්, වගකීම්, අයිතිවාසිකම් සහ බැඳීම් මෙම ගිවිසුම්වල පැහැදිලිව දැක්විය යුතුය.

2.3 බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් වෙළෙඳ අයදුම්පත් විමර්ශනය කර, අදාළ අන්තර්ජාල පදනම් කරගත් ගෙවීම් වේදිකාවෙහි/ද්වාරයෙහි ලියාපදිංචි වීමට වෙළෙඳුන්ට අනුමැතිය ලබාදිය යුතුය. වෙළෙඳපොළ යෙදීම් සමාලෝචනය කිරීමේදී, සේවා සැපයුම්කරුවන් විසින් සපයන ලද වෙළෙඳුන්ගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල තොරතුරු සහ සමාගම් පැතිකඩ පිළිබඳව බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් සැලකිලිමත් විය යුතුය. එක් එක් අන්තර්ජාල පදනම් කරගත් ගෙවීම් වේදිකාවෙහි/ද්වාරයෙහි ලියාපදිංචි කළ සියලුම වෙළෙඳුන්ගේ වාර්තාවක් බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් පවත්වාගෙන යා යුතුය.

2.4 කාඩ්පත් හිමියන්ගේ දත්ත පිළිබඳ රහස්‍යභාවය සුරක්ෂිත කර ගැනීමට සහ කාඩ්පත් අංකය, කාඩ්පත් ආරක්ෂණ කේතය සහ කල්ඉකුත්වීමේ දිනය වැනි කාඩ්පත් හිමියන්ගේ සංවේදී තොරතුරු ලබාගැනීමට සේවා සැපයුම්කරුවන්ට නොහැකි බවට බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් සහතික විය යුතුය.

2.5 බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් අදාළ අන්තර්ජාල ගෙවීම් වේදිකාව/ද්වාරය හරහා සිදු කරනු ලබන ගනුදෙනුවලට අදාළ ගෙවීම් පහසුකම සැලසීම සඳහා එක් එක් අන්තර්ජාල ගෙවීම් වේදිකාව/ද්වාරය සඳහා බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන්ට අයත් වෙන් කරන ලද ගිණුමක් බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් පවත්වාගෙන යා යුතුය. අසාර්ථක හෝ විවාදිත ගනුදෙනු සඳහා මුදල් ආපසු දීමට ද මෙම ගිණුම හරහා පහසුකම් සැලසෙනු ඇත.

2.6 අරමුදල් ලැබීමෙන් පසු ව්‍යාපාරික දින තුනක් (03) ඇතුළත වෙළෙඳුන්ට අවසාන ගෙවීම් සිදු කෙරෙන බවට බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් සහතික විය යුතුය.

2.7 අන්තර්ජාල ගෙවීම් වේදිකාවක්/ද්වාරයක් මාර්ගයෙන් සිදු කරන ලද ගනුදෙනු සම්බන්ධ ගැටලු විසඳීම සඳහා ගෙවීම් කාඩ්පත් යෝජනා ක්‍රමයට අදාළ ආරවුල් නිරාකරණය කිරීමේ මාර්ගෝපදේශ අනුව බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් වැඩිදියුණු කළ යුතුය.

2.8 අන්තර්ජාල ගෙවීම් වේදිකාවේ/ද්වාරයේ මෙහෙයුම්, බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් අධීක්ෂණය කළ යුතුය.

3. බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් අන්තර්ජාල ගෙවීම් වේදිකාව/ද්වාරය තුළ කාඩ්පත් ගෙවීම් සඳහා පහසුකම් සැලසීමට පෙර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරු හා සේවා සැපයුම්කරු විසින් අත්සන් කිරීමට නියමිත ගිවිසුමෙහි පිටපතක් බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය. එක් එක් අන්තර්ජාල ගෙවීම් වේදිකාව/ද්වාරය සඳහා වෙන් වෙන් වශයෙන් සේවා සැපයුම්කරුවන් සමග බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් ගිවිසුම් තබාගත යුතුය.

4. අන්තර්ජාල ගෙවීම් වේදිකාව/ද්වාරය හරහා ගෙවීම් කාඩ්පත් මගින් සිදු කෙරෙන විද්‍යුත් වාණිජ ගනුදෙනු අත්පත් කර ගැනීමේදී අදාළ වන නීති හා රෙගුලාසි වලට අනුකූල වන බවට බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් සහතික විය යුතුය.

5. එක් එක් අන්තර්ජාල ගෙවීම් වේදිකාව/ද්වාරය සඳහා ඇගයීම් වාර්තාවක් ත්‍රෛමාසිකව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

සී. ජේ. පී. සිරිවර්ධන
**නියෝජ්‍ය අධිපති**